# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,924/2 — 1970 සැප්තැම්බර් 20 වැනි ඉරිද — 1970.9.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී 129/47 ඩී 8/69.

### 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාව

### 61 වැනි වගන්තිය යටතේ ආඥාව

1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද ආඥාව.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දිය.

### අංක 197 දරණ ආඥාව

මෙහි වූ උපලේඛනයෙහි I වැනි තීරයෙහි නිශ්චිත බලතල එම උපලේඛනයෙහි II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි නිශ්චිත නිලධාරියාට, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, මෙයින් පවරනු ලැබේ:—

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලැබිය හැකි උපදෙස් අනුව, එම බලතල ක්‍රියාවේ යෙදවිය යුතුය;

(ආ) මෙ ආඥාව යටතේ එබඳු නිලධාරියෙකු වෙත පවරන ලද යම් බලතල යටතේ එම නිලධාරියා විසින් කරනු ලැබූ තීරණයක් පිළිබඳව සෑහීමට පත් නොවූ යම් තැනැත්තෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකිය;

(ඇ) දඬුවම් දීම පිළිබඳව එබඳු නිලධාරියෙකු වෙත පවරනු ලැබූ කවර බලතල වුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාවේ යෙදවිය යුතුයයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එම බලතල ඒ නිලධාරියා විසින් එම අවස්ථාවේදී ක්‍රියාවේ යෙදවීම නොකළ යුතුය;

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනය කිරීම සඳහා 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තියෙන් පැවරුණු අයිතිවාසිකම් හීනකිරීමක් හෝ ඒ අයිතිවාසිකම් කෙරෙහි අන් ලෙසකින් බලපෑමක් හෝ මෙ ආඥාවෙහි සඳහන් කිසිවකින් සිදුවෙතැයි නොසැලකිය යුතුය. නැතහොත්, එලෙස තේරුම් නොගත යුතුය.

3. 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තිය යටතේ පනවන ලදුව, !955 ඔක්තෝබර් මස 7 වැනි දින අංක 10,847 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, අංක 83 දරන ආඥාවෙහි කුමක් සඳහන් වුවද, මෙ ආඥාව බලපැවැත්ය යුතුය.

4. 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් පවරන ලදුව, වරින්වර ගැසට් පත්‍රයේ පළ කරන ලද දඬුවම් දීමේ බලතල හෝ මින් මතුව පැවරීමට හැකිවන, දඬුවම් දීමේ බලතල කිසිවක් කෙරෙහි, කවර අන්දමක හෝ බල පෑමක් මෙ ආඥාවෙහි සඳහන් කිසිවකින් සිදුනොවිය යුතුය.

5. මෙහි වූ උපලේඛනයෙහි අංක 1 දරන විෂයයෙන් පවරනු ලබන පත්කිරීමේ බලය, 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තිය යටතෙහි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් පවරනු ලැබ වරින්වර ගැසට් පත්‍රයේ පළ කරන ලද සම් පත් කිරීමේ බලයකට හෝ මින්මතු පැවරිය හැකි යම් පත් කිරීමේ බලයකට කිසිලෙසකින් බල නොපෑ යුතුය.

6. මෙහි වූ උපලේඛනයෙහි I වැනි තීරයෙහි සඳහන් කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනය වූකලී විටින් විට ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනවලින් පසුව සංශෝධනය කරන ලද පරිදි වූ, 1968 ජූලි මස 26 වැනි දින අංක 14,811/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1968 ජූලි මස 25 වැනි දින දරන කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" දරන උපලේඛනය වේ.

7. 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තිය යටතේ පනවන ලදුව, 1970 පෙබරවාරි මස 13 වැනි දින අංක 14,893 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1970 ජනවාරි මස 28 වැනි දින අංක 192 දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

## උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| 1. කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි III වැනි පන්තියෙහි දක්වා ඇති තනතුරුවලට සහ වරින්වර ඇතුළත් කළ හැකි වෙනත් තනතුරුවලටද පත් කිරීමේ බලය | පත්වීම කළයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා |
| 2. ඇමතිවරයෙකුට පවරන ලද දෙපාර්තමේන්තු සම්බන්ධයෙන්, එහෙත් රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව හැර, කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි I, Iඒ සහ II වැනි පන්තිවල දක්වා ඇති තනතුරුවලට සහ වරින්වර ඇතුලත් කළ හැකි වෙනත් තනතුරුවලට ද පත් කිරීමේ බලය | අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් වෙනම තනතුරක් නොපවත්නා අවස්ථාවන්හිදී, විෂය භාර සහකාර ලේකම් |
| 3. අගමැති කාර්යාලය සම්බන්ධයෙන්, කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි I, Iඒ සහ II වැනි පන්තිවල දක්වා ඇති තනතුරුවලට සහ වරින් වර ඇතුළත් කළ හැකි වෙනත් තනතුරුවලට ද පත් කිරීමේ බලය | රාජ්‍ය ආරක්ෂක සහ විදෙශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| 4. ඔඩිටර් ජනරාල්ගේ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන්, කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි I, Iඒ සහ II වැනි පන්තිවල දක්වා ඇති තනතුරුවලට සහ වරින් වර ඇතුළත් කළ හැකි වෙනත් තනතුරුවලට ද පත් කිරීමේ බලය | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ඔඩිටර් ජනරාල් |
| 5. මැතිවරණ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන්, කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි I, Iඒ සහ II වැනි පන්තිවල දක්වා ඇති තනතුරුවලට සහ වරින් වර ඇතුළත් කළ හැකි වෙනත් තනතුරුවලට ද පත් කිරීමේ බලය | මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු සහ ප්‍රාදේශීය බල මණ්ඩල) |
| 6. පහත සඳහන් දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි I, Iඒ සහ II වැනි පන්තිවල දක්වා ඇති තනතුරුවලට සහ වරින්වර ඇතුළත් කළ හැකි වෙනත් තනතුරුවලට ද පත්කිරීමේ බලය :—<br>(අ) රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව<br>(ආ) කැබිනට් කාර්යාලය<br>(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය<br>(ඈ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය<br>(ඉ) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභා නායක කාර්යාලය<br>(ඊ) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ විපක්ෂ නායක කාර්යාලය | රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් |
| 7. කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි දක්වා ඇති තනතුරු සහ වරින් වර ඇතුළත් කළ හැකි වෙනත් තනතුරු ද උසුලන සේවකයන්ගෙන් යම් තැනැත්තෙකු, අධිකරණයෙන් වරදකරුවීමේ හේතුවෙන් හැර, වෙනත් යම් හේතුවක් මත විෂමාචාරය නිසා සේවයෙන් පහකිරීමේ හෝ අන්‍යාකාරයකින් දඬුවම් කිරීමේ බලය | දෙපාර්තමේන්තු ප්‍රධානයා |
| 8. කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි දක්වා ඇති තනතුරු සහ වරින් වර ඇතුළත් කළ හැකි වෙනත් තනතුරු ද උසුලන සේවකයන්ගෙන් යම් තැනැත්තෙකුට අධිකරණයෙන් වරදකරුවීමේ හේතුවෙන් හැර, වෙනත් යම් හේතුවක් මත, තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ බලය හෝ, සතියක වැටුපට වැඩි නොවන දඩයක් ගැසීමෙන් හෝ, වැටුප් වැඩිවීම අවුරුද්දකට නොවැඩි කාලයකට තාවකාලිකව අත්හිටුවීමෙන්, නතර කිරීමෙන්, අඩු කිරීමෙන් නැතහොත් විලම්භනය කිරීමෙන් දඬුවම් කිරීමේ බලය | දෙපාර්තමේන්තු ප්‍රධානයා |
| 9. කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි "එස්" උපලේඛනයෙහි දක්වා ඇති තනතුරු සහ වරින් වර ඇතුළත් කළ හැකි තනතුරු ද උසුලන සේවකයන්ගෙන් යම් තැනැත්තෙකු විශ්‍රාම ගැනීමේ වෛකල්පික වයසට එළඹුණු විට විශ්‍රාම ගැන්වීමේ බලය | පත්වීම් කිරීමේ බලධරයා |

9—1035

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය—අංක 61/9/460

ආදායම් සංරක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලදුව, 1962 මාර්තු මස 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1970 සැප්තැම්බර් මස 21 වෙනි සඳුදිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :

### රබර්

| | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... | 0 99 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව රාත්තලකට ... ... ... ... | 0 04 |

ඒ. ඊ. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 781,
1970 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

9—1086

## රේගු දැන්වීම—අංක 67/3/148

1967 නොවැම්බර් මස 22 වැනි දින අංක 14,775/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1968.2.22 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1970 සැප්තැම්බර් මස 21 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල සක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,210·22 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අමු පොල්ගෙඩි 1,000 ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|---|---|---|
| රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 364 08 | ... | 404 76 | ... | 343 74 | ... | 91 02 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥා පනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ඒ. ර්. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 744/22,
1970 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදීය.

9—1085

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.